# සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - ඌව පළාත

**DEPARTMENT OF HEALTH SERVICES - UVA PROVINCE**

சுகாதார சேவைத் திணைக்களம் -ஊவா மாகாணம்

අංක 301 ආර් එච් ගුණවර්ධන මාවත - බදුල්ල # 301, R.H. Gunawardana Mawatha, Badulla.


මගේ අංකය / My No. UH/EC/වා.ස්.මා./2023 .  ඔබේ අංකය / Your No.  දිනය / Date 2023.01. 30

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
බදුල්ල/මොණරාගල.

වෛද්‍ය අධිකාරී,
මූලික රෝහල,
දියතලාව, මහියංගණය,වැලිමඩ,වැල්ලවාය,බිබිල, සියඹලාණ්ඩුව

<u>2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග- සෞඛ්‍ය සේවය</u>

උක්ත කරුණට අදාලව මාගේ සමාංක හා 2022.12.18, 2022.12.22 හා 2022.12.30 දිනැති ලිපි මගින් ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් සේවා ස්ථාන වල සේවයේ නියුතු හෙද සේවය, පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි තනතුර, පවුල් සෞඛ්‍ය සේවය, ඖෂධවේදී සේවය, ඖෂධ සංයෝජක සේවය, වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ සේවය, භෞත චිකිත්සක සේවය, විකිරණ ශිල්පී, විද්‍යුත් හෘද්‍ය රේඛන ශිල්පී, මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී, අක්ෂි තාක්ෂණ, පාසල් දන්ත චිකිත්සක, ලියාපදිංචි වෛද්‍ය සේවය, ඉසීම් යන්ත්‍ර ක්‍රියාකරු, සෞඛ්‍ය මුරකරු, වාට්ටු ලිපිකරු, මැහුම් සේවිකා, විදුලි සෝපාන ක්‍රියාකරු, වඩුකාර්මික, උපස්ථායක, සෞඛ්‍ය කාර්ය සහායක (සාමාන්‍ය), සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ), ආදී තනතුරු වලට අයත් නිලධාරින්ගේ සහ සේවකයින්ගේ ස්ථාන මාරු 2023.02.01 දින සිට ක්‍රියාත්මක වන බව දැනුම් දී ඇත.

02. එහෙත්, මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති අංක 20 හා 2023.01.25 දිනැති "පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023 රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපළ මැතිවරණ කාලසීමාව තුළදී අනිසි ලෙස භාවිතා කිරීම වැලැක්වීම සහ ඡන්ද විමසීම පැවැත්වෙන පළාත්වලට අදාල නිලධාරින්, සේවකයින් බඳවා ගැනීම/උසස් කිරීම/මාරු කිරීම සීමා කිරීම" නමැති චක්‍රලේඛයේ ඡේද අංක 09 (i) වගන්තිය මඟින් **ස්ථාන මාරුවීම් 2023 මාර්තු මස 20 වන දින දක්වා අත්හිටුවිය යුතු බව දන්වා ඇත.**

03. ඒ අනුව, මෙම ස්ථාන මාරු නියෝග 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමෙන් පසුව ක්‍රියාත්මක කරන බවත්, ස්ථාන මාරු ක්‍රියාත්මක කරන දිනය පසුව දැනුම් දෙන බවත් කාරුණිකව දන්වා සිටිමි.

වෛද්‍ය ජේ.සී.එම්.තෙන්නකෝන්
ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

පිටපත - ලේකම්, ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය - දැ.ගැ.ස.


**Telephone Numbers**

General : 055- 4938052 Fax : 055-2223098 / 055-2222823 Provincial Director : 055-4938040
MO Planning : 055- 4938044 Accountant : 055 - 4938041 / 055-2231981 Administrative Officer : 055-4938043 / 055-2229694

**Email :**
pdhsplanning@gmail.com
uvaprovince.pdhs2020@gmail.com
pdhsuvaacc@gmail.com